**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් රු.854,977 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ආ) රු.1,796,517 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 02 ක් ප්‍රාග්ධන ගතකර නොතිබුණි.

(ඇ) පුර නැඟුම ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.4,262,025 ක් ණයගැති ගිණුම බැර කිරීම හේතුවෙන් ප්‍රාග්ධන ආධාර ලැබීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පුරනැගුම ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා සභා අරමුදලින් වැයකර තිබුණු රු.355,698 ක් ප්‍රාග්ධන ගත කර නොතිබුණි.

(ඉ) පුර නැගුම ව්‍යාපෘතිය යටතේ ලැබී තිබුණු ප්‍රාග්ධන ආධාර රු.806,395 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල රු.3,546,356 ක්වූ එකතු කල අගය මත බදු ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

**---------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 07 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපලේඛන/ උපයෝගී පොත් අනුව ශේෂ අතර රු.6,607,318 ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ තොග ගිණුම් 04 ක ශේෂ හා මූල්‍ය ප්‍රකාශන ශේෂ අතර රු.2,575,609 ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් අතර ශේෂය රු. 16,802,204/- ක වෙනසක් පැවතුණි.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

**---------------------**

2014 දෙසැම්බර් සිට පිළියෙල කර තිබුණු මාසික බැංකු සැසඳුම් ප්‍රකාශවල පවතින රු.384,602 ක් වූ අවිනිශ්චිත ගිණුම හා රු.33,955 ක අගරු චෙක්පත් 2018 අප්‍රේල් වනවිටත් නිරවුල් කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**------------------------------------**

(අ) ලැබිය යුතු ගිණුම්

---------------------

ලැබිය යුතු ගිණුම් ශේෂය තුල පවතින විස්තරාත්මක තොරතුරු අනාවරණය කර නොගත් රු.151,793,850 ක ශේෂ සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

ගෙවිය යුතු ගිණුම් ශේෂය තුල පවතින විස්තරාත්මක තොරතුරු අනාවරණය කර නොගත් රු.23,124,936 ක ශේෂ සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**---------------------------------------------------**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 347,895,628 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කළ නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

**---------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | |
| (i) 129(2) (අ)සහ (ඊ) වගන්ති | 174,347,175 | ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු උසාවි දඩ, මුද්දර ගාස්තු හා බදු කුලී අයකරගෙන නොතිබුණි. |
| (ii) 136 වගන්තිය | 5,269,952 | සභාවට අයත් බදු දේපලවල රු.4,846,680 ක වරිපනම් සහ රු.423,272 ක අක්කර බදු අයකරගෙන නොතිබුණි. |
| (iii) 143 වගන්තිය | 4,867,000 | සභා බල ප්‍රදේශය තුළ වූ ගොඩනැගිලි සෑම වර්ෂ 05 කට වරක් තක්සේරු කර බදු අය කරගෙන නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති | | |
| (i) අංක 5(3) රීතිය | | ආදායම් එක් රැස්කිරීමට අදාලව අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ii) අංක 5(7) රීතිය | | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. |
| (iii) අංක 10(2) රීතිය | | ඉලක්ක දිනයන්ට අනුකූල වන පරිදි එක් එක් ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙන බවට වග බලා ගෙන නොතිබුණි. |
| (iv) අංක 10(8) රීතිය | | සභාව සතු වත්කම් විෂයයන් 03 ක් අස්ථානගතවීම තුල දේපල සම්බන්ධ සුරක්ෂිතතාවය ආරක්ෂා වන අයුරින් කටයුතු කර නොතිබුණි. |
| (v) අංක 33 රීතිය | | වරිපනම් බදු ගෙවීම පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තු අවසානයේදී පිළියෙල කර නොතිබුණි. |

| | |
|---|---|
| (vi) අංක 61 වගන්තිය | සභා බල ප්‍රදේශයේ පිහිටි සියළුම කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් අදාල ලේඛනයේ සටහන් කර නොතිබුණි. |
| (vii) අංක 66 වගන්තිය | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(4) අනුව සභා ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. |
| (ix) අංක 141 රීතිය | පී.එස්. 39 ආකෘතිය ප්‍රකාරව තැන්පතු ලෙජරය පවත්වා නොතිබුණි. |
| (x) අංක 163 රීතිය | සාරාංශ ආදායම් ලේඛනය අදාළ රීති අනුව පිළියෙල කර නොතිබුණි. |
| (xi) අංක 193 රීතිය | වාර්ෂික අයවැය ලේඛනය අනුව වර්ෂය අවසානයට අතිරික්ත/ඌනතා පිලිබඳ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. |
| (xii) අංක 218 රීතිය | සභාවේ සියළු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කරවීම සිදුකර නොතිබුණි. |

**1.3.7 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

විධිමත් අනුමැතියකින් තොරව එකතුව රු.29,429,767 ක්වූ හිඟ ආදායම් කපා හැරීමට අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.123,568,433 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වූ වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.137,039,973 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

---------------

සභාව සතු බැංකු ජංගම ගිණුම් 03 ක් වර්ෂ ගණනාවක සිට අක්‍රීයව පවතින අතර, එම ගිණුම්වල පවතින එකතුව රු.1,416,145 ක් ඵලදායී ආයෝජනයක යෙදවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. |
| (i) වරිපනම් බදු | 11,991,000 | 13,028,515 | 9,928,182 | 4,866,874 | 12,003,000 | 10,062,260 | 13,271,274 | 4,562,964 |
| (ii) බදු කුලී | 42,894,000 | 69,419,346 | 68,234,540 | 4,465,626 | 34,447,000 | 39,184,615 | 39,301,304 | 6,538,577 |
| (iii) බලපත්‍ර ගාස්තු | 6,696,000 | 7,078,644 | 7,078,644 | - | 6,048,000 | 10,965,470 | 10,965,470 | - |
| (iv) වෙනත් ආදායම් | 213,131,000 | 242,130,373 | 170,998,480 | 170,612,234 | 201,970,000 | 245,749,071 | 191,162,142 | 228,280,375 |

සටහන:- රැස්කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායමෙන් එකතුකිරීම් සහ ඉකුත් වර්ෂවල හිඟ ආදායමෙන් එකතුකිරීම්ද ඇතුලත් වේ.

**2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම් රු. මිලියන 331.7 කින් රු. මිලියන 256.2 ක් වර්ෂය තුල රැස්කරගෙන තිබුණු අතර එය සියයට 77 කට සමාන අගයක් විය. සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.මිලියන 239 ක් වූ හිඟ ආදායමින් වර්ෂය අවසානය වනවිට තවදුරටත් රු. මිලියන 180 ක් අයකර ගැනීමට තිබුණි.

**2.3.3 වරිපනම් හා බදු**

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම් රු.13,028,515 කින් සියයට 43 කට සමානව රු.5,601,847 ක් හා ඉකුත් වර්ෂවල හිඟ ආදායම්වලින් රු.3,439,572 ක් රැස්කරගෙන තිබුණි.

**2.3.4 කුලී**

සමාලෝචිත වර්ෂය සඳහා රු.69,419,346 ක් වූ බිල්කළ ආදායමෙන් සියයට 98 කට සමානව රු.68,184,150 ක් රැස්කරගෙන තිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.33,339,638 ක් හා මුද්දර ගාස්තු රු.118,608,936 ක් ලැබිය යුතුව පැවතුණි.

**2.3.6 අධිභාර**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව පනවන ලද අධිභාරවලින් 2017 දෙසැම්බර් 31 දිනට රු. 326,335 ක් අයකර ගැනීමට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වනවිට ප්‍රධාන කාරණා 04 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

**(ආ) ක්‍රියාකාරී සැළැස්ම**

-------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා සභාව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) ප්‍රතිපාදන නොසැලසීම**

-----------------------

පිළියෙල කර තිබුණු වාර්ෂික සංවර්ධන සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ නව ආදායම් ප්‍රභව හඳුනා ගැනීම, දේපළ තක්සේරු කිරීම, බදු පැනවීම, අතුරු ව්‍යවස්ථා සම්පාදනය හා ආදායම් ඒකරාශී කිරීම යන කර්තව්‍යයන් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**(ඈ) ක්‍රියාත්මක නොකල කර්තව්‍යයන්**

---------------------------------------

වාර්ෂික අයවැය මගින් රු.8,415,000ක ප්‍රතිපාදන සළසා තිබුණු කර්තව්‍යයන් 08 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඉ) අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම**

---------------------------------------------

සංවර්ධන සැළැස්ම අනුව රු.32,020,000 ක් වූ විවිධ කර්තව්‍යයන් 43 ක් ඉටු කිරීම සඳහා රු.4,019,383ක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි.

**(ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් දිනකට කසළ ටොන් 15 ක් පමණ එකතු කරනු ලබන අතර ඉන් සුළු ප්‍රමාණයකින් කොම්පෝස්ට් පොහොර නිපදවා ඉතිරි සියළුම කසළ බාහිර පාර්ශ්වයකට අයත් ඉඩමකට බැහැර කර තිබුණි.

(ii) කසළ රැස්කරන ස්ථානයන්හි එකතුවන අන්තරාදායී අපද්‍රව්‍ය, ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ කසළ කළමනාකරණය සඳහා රු.3,975,000 ක් වැයකර තිබුණු අතර කොම්පෝස්ට් අංගනයේ කටයුතු සඳහා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණි.

**(උ) තිරසර සංවර්ධන ඉලක්ක**

-----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. එහෙත් දිළිඳුකම පාලනය කිරීම, සෞඛ්‍ය වැඩසටහන්, පිරිසිදු ජලය ලබාදීම සහ වෙනත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමුකර තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කොම්පෝස්ට් පොහොර අලෙවිය සඳහා රු.910,000 කට වෑන් රථයක් මිළදීගෙන තිබුණද, එය වෙනත් කාර්යයන් සඳහා උපයෝගී කරගෙන තිබුණි.

(ආ) සභාවේ ප්‍රධාන කාර්යාලයේ සහ උප කාර්යාලවල සේවයේ නියුක්ත කාර්යය මණ්ඩලයේ පැමිණීම/පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර සවිකර තිබුණද, ඒවායේ පරිපාලනය ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඇ) 2015 වර්ෂයට පෙර රු.39,061,531ක්වූ ගෙවිය යුතු ශේෂයක් තැන්පත් ආදායමට නොගෙන විලම්භිත ගෙවිය යුතු ගිණුමකට මාරු කර තිබුණි.

(ඈ) කාර්යය මණ්ඩලයේ කිහිපදෙනෙකු විසින් නිවාඩු අනුමත කරගැනීමකින් තොරව විදේශගතව තිබුණි. තවද, රියදුරෙකු විසින් තම විදේශ නිවාඩු සම්බන්ධ ගිවිසුම් පත්‍රය ප්‍රකාරව සේවය කළ යුතු වර්ෂ ගණනට පෙර නැවත විදේශගතවී තිබුණි.

(ඉ) සභාවේ නිවාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ද්විතීයික තනතුරු 13 ක පුරප්පාඩු හා විධායක, ප්‍රාථමික හා වෙනත් වශයෙන් 79 ක අතිරික්තයක් විය. තවද, අනියම් පදනම මත ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 03 දෙනෙක් සේවයේ යොදවාගෙන තිබුණි.

(ආ) සේවය හැරගිය නිලධාරියෙකුගෙන් සහ ස්ථාන මාරුවී ගිය 05 දෙනෙකුගෙන් පිළිවෙලින් රු.54,675 ක් සහ රු.443,635 ක් අයකර ගත යුතුව තිබුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2015 වර්ෂයට පෙර රු.39,061,531 ක් වූ ගෙවිය යුතු ශේෂයක් තැන්පත් ආදායමට නොගෙන විලම්භිත ගෙවිය යුතු ගිණුමකට මාරු කර තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, පවතින ඉඩම්වල නිරවුල් ඔප්පුද ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

**-----------------------------------------**

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණු පර්චස් 30 ක් වෙනුවෙන් බදු ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි.

**3.5.3 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

**-----------------------------------**

1991 වර්ෂයේදී රු. 4,595,663 කට මිළට ගෙන තිබුණු ලියාපදිංචි අංක රහිත මෝටර් ග්‍රේඩරයක් කම්මල්පත්තුව උප කාර්යාලයේ නිශ්ක්‍රීය තත්ත්වයෙන් ගාල් කර තිබුණි.

**3.6 ප්‍රසම්පාදනය**

**-------------**

**ප්‍රසම්පාදන සැළැස්ම**

**---------------------**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට මෙන්ම ඉකුත් වර්ෂවලට අදාලව ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය**

**-------------------------------------**

**4.1 අයවැය පාලනය**

**----------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අයවැය ලේඛනයට ඇතුළත් කර නොතිබුණු ප්‍රාග්ධන විෂයයන් 13 කට රු.15,278,500 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ සුභසාධනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 43 ක් යටතේ රු6,480,000 ක් වෙන්කර තිබුණද අදාල කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ඇ) ප්‍රාග්ධන විෂයයන් 10 කට රු.37,100,000 ක් වෙන්කර තිබුණද, එයින් විෂයයන් 09 ක රු.36,970,200 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

**---------------------**

සභාවේ මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.3 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

**-------------------------------------------------------------**

ඉකුත් වර්ෂයේ දී හඳුනාගත් පහත දැක්වෙන පාඩු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(i) සභාව සතු රු.255,000 ක වත්කම් බාහිර පාර්ශවයන්ට නොමිලේ පවරා දීමෙන් සහ රු.177,100 ක් වූ ගැලවනයිස් බට 161 ක් අස්ථානගතවීමෙන් සභාවට පාඩුවක් සිදුවී තිබීම

(ii) ලැබිය යුතු ආදායම්වලින් රු.30,756,510 ක් සහ ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු. 28,252,666 ක් විධිමත් අනුමැතියකින් තොරව කපා හැර තිබීම

## 5. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | ගිණුම් පොත්පත්, ප්‍රා.ස. වාර්තා හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| (ආ) වත්කම්/දේපළ | (i) ලේඛනගත නොකිරීම<br>(ii) ආරක්ෂාව තහවුරු නොකිරීම |
| (ඇ) තොග | අවසන් තොග නිවැරදිව ගිණුම්වලට ගෙන නොතිබීම |
| (ඈ) ණයගැති/ණයහිමි | (i) උපලේඛන පිළියෙල නොකිරීම<br>(ii) කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම |
| (ඉ) සේවක කළමනාකරණය | (i) කාර්ය මණ්ඩලය අනුමත කර නොගැනීම<br>(ii) පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |
| (ඊ) ආදායම් පරිපාලනය | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් අයකර නොගැනීම |